විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு

MINISTRY OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM

# මාධ්‍ය නිවේදනය

**විදේශ අමාත්‍ය විජිත හේරත් මහතා පිලිපීනයේ පැවැත්වෙන ආසියාන් කලාපීය සංසදයේ 33 වැනි අමාත්‍ය මට්ටමේ රැස්වීමට සහ මිත්‍රත්වය හා සහයෝගීතාව පිළිබඳ ගිවිසුමේ 50 වැනි සංවත්සර සැමරුමට සහභාගී වෙයි.**

විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍ය විජිත හේරත් මහතා, 2026 ජූලි 23 සිට 24 වැනි දින දක්වා පිලිපීනයේ මැනිලා නුවර පැවැත්වෙන ආසියාන් කලාපීය සංසදයයේ 33 වැනි අමාත්‍ය මට්ටමේ රැස්වීමට සහ මිත්‍රත්වය හා සහයෝගීතාව පිළිබඳ ගිවිසුමේ 50 වැනි සංවත්සර සැමරුම් උත්සවයට සහභාගී වීමට නියමිතය.

අමාත්‍ය හේරත් මහතා මෙම අවස්ථා දෙකේදීම දේශන පැවැත්වීමට නියමිතය.

මෙයට සමගාමීව, අමාත්‍යවරයා විසින් මෙම රැස්වීමවලට සහභාගී වන රටවල විදේශ අමාත්‍යවරුන් කිහිපදෙනෙකු, ආසියාන් මහලේකම්වරයා සහ යුරෝපා සංගමයේ හා ආසියානු සංවර්ධන බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟද ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වීමට නියමිතය.

එමෙන්ම, පිලිපීනයේ විදේශ කටයුතු ලේකම් මා. තෙරේසා පී. ලසාරෝ මහත්මිය සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වීමටද අමාත්‍යවරයා සැලසුම් කර ඇත.

මෙම සංචාරය අතරතුර, විදේශ අමාත්‍යවරයාගේ සහභාගිත්වයෙන් මින්දනාඕ හි ශ්‍රී ලංකාවේ නිර්වේතනික කොන්සල් කාර්යාලය නිල වශයෙන් විවෘත කිරීමටද අපේක්ෂා කෙරේ.

**විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය**
**කොළඹ**

**2026 ජූලි 22** වැනි දින


Foreign Affairs
විදේශ කටයුතු
வெளிநாட்டு அலுவல்கள்
Republic Building, Colombo 1
ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 1
குடியரசுக் கட்டிடம், கொழும்பு 1
☎ 2 325 373/5, 2 207 200/7
cypher@mfa.gov.lk

Foreign Employment
විදේශ රැකියා
வெளிநாட்டு வேலைவாய்ப்பு
17th Floor, "Mehewara Piyesa", Narahenpita, Colombo 5
17 වන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 5
17 அவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 5
☎ 2 331 200
info@mfe.gov.lk

Tourism
සංචාරක
சுற்றுலாத்துறை
No 03, Times Building, Bristol Street (Sir Razik Fareed Mw), Colombo 1
අංක 03, ටයිම්ස් ගොඩනැගිල්ල, බ්‍රිස්ටල් වීදිය (සර් රාසික් ෆරීඩ් මාවත), කොළඹ 1
இல.03, டைம்ஸ் கட்டிடம், பிரிஸ்டல் தெரு (சர் ராசிக் ஃபரீத் மாவத்தை), கொழும்பு 1
☎ 2 381 798, 2 321 222
secretary@tourismmin.gov.lk